විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 06/2017

මගේ අංකය- විවැ/චක්‍රලේඛ/06/2017
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10.
2017-11-08

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

**2016.01.01 දිනයෙන් පසුව රාජ්‍ය සේවයට හා පළාත් රාජ්‍ය සේවයට පත්වීම් ලද නිලධාරීන් හා නිලධාරිණියන්ගෙන් වැන්දඹු /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අය කිරීම.**

රජයේ නිලධාරීන් සඳහා නව විශ්‍රාම ක්‍රමය හඳුන්වාදීමට අදාළව පත්වීම් ලිපිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2017.08.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2017 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

02. ඒ අනුව 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2016.01.01 දිනෙන් පසු පත්වීම් ලබා දී ඇති රාජ්‍ය නිලධාරීන්ගේ පත්වීමේ ලිපිවල 6 වන වගන්තිය පහත පරිදි සංශෝධනය කර ඇත.

**"මෙම පත්වීම් විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. "**

03. ඉහත වගන්තිය අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2016 හි 12 වැනි වගන්තිය අනුව දායක මුදල් අයකරනු ලැබිය යුතුය. එම චක්‍රලේඛය පරිදි, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප සඳහා උප ලේඛන II හි සඳහන් මූලික වැටුපෙන් දායක මුදල් අය කිරීම පහත සඳහන් පරිදි විය යුතුය.

ප්‍රාථමික හා ද්විතීය මට්ටම - 6%

තෘතීය හා ජ්‍යෙෂ්ඨ මට්ටම - 7%

04. 2015.04.07 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 02/2015 පරිදි වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමය යටතේ ලියාපදිංචිය අන්තර්ජාලය හරහා සිදුකරනු ලබන අතර 2016.01.01 පසු පත්වීම් ලද සියලුම නිලධාරීන් ඉහත ක්‍රමය යටතේ ලියාපදිංචි විය යුතුය.

05. මේ දක්වා දායක මුදල් අය වී නොමැති නිලධාරීන්ගේ දායක මුදල් 2016.01.01 සිට අයකළ යුතු අතර එම මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුමට බැර කල යුතුය.

06. 2016.01.01 දිනට පසු පත්වීම් ලබා සේවයේ යෙදී සිටියදී මියගිය නිලධාරීන්ගේ වැන්දඹුවන් සඳහා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 06/2015 හි 3 වන ඡේදය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකල යුතුය.

**ඒ.ජගත් ඩී.ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

| | | |
|---|---|---|
| පිටපත් : 1. ජනාධිපති ලේකම් | - | කරු.දැ.ගැ.ස |
| 2. අග්‍රාමාත්‍ය ලේකම් | - | එම |
| 3. අමාත්‍ය මණ්ඩල ලේකම් | - | එම |
| 4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | - | එම |
| 5. විගණකාධිපති | - | එම |